
ජනි සටන

# පංති සටන



| | |
|---|---|
| පරි. අංක | 6717 |
| වර්ග අංකය | 390 |
| දිනය | |

# පටුන


## පක්ෂය දිනවන ගමනක ඇරඹුම ............. 07

ගාල්ල සමනල ක්‍රීඩාංගණයේ පැවැති
මැයි දින රැලිය අමතමින් ජනාධිපතිතුමා කළ කතාව

## පංති සටන ............................ 17

ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ
65වන සංවත්සර උළෙල අමතා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සභාපති
ජනාධිපති ගරු මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා කළ කතාව

## ශ්‍රී ලාංකීය ජාතියක් ....................... 33
## ගොඩනැඟීමේ වගකීම

එක්සත් ජාතික පක්ෂයේ 70 වන සංවත්සර උළෙල අමතා
ජනාධිපති ගරු මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා කළ කතාව



# පක්ෂය දිනවන ගමනක ඇරඹුම

මා ඉතාමත් සතුටු වෙනවා 2016 වසරේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ප්‍රමුඛ එක්සත් ජනතා නිදහස් සන්ධානයේ මෙම ඓතිහාසික ජනහමුව ගාලු පුරවරයේ පැවැත්වීමට ලැබීම ගැන. ශාන් විජේලාල් මැතිතුමා, චන්දිම වීරක්කොඩි මැතිතුමා ඇතුළු මැතිඇමැතිවරුන් සහ එක්සත් ජනතා නිදහස් සන්ධානයේ මහලේකම් මහින්ද අමරවීර මැතිතුමා, සන්ධානයේ නායකයින් ඇතුළු පිරිස මේ මැයි රැලිය සාර්ථක කරගැනීමට විශාල සහායක් ලබාදුන්නා.

දිප ව්‍යාප්තව විවිධ ප්‍රදේශවල තිබෙන මැයි රැලි 49ක් තුළින් වැඩිම ජනතාවක් සහභාගි වන මැයි දින රැලිය මෙම මැයි රැලිය බව පොලිසිය වාර්තා කරනවා. මෙම මැයි රැලිය සාර්ථක කරගන්න සහාය දුන්න දේශපාලන පක්ෂවල, වෘත්තිය සමිති ව්‍යාපාරවල, අනෙකුත් සියලු අංශවල සියලු දෙනාටත් අපේ ගෞරවනීය ස්තුතිය පුද කරනවා. මෙම මැයි දිනයත් සමඟ අප රටට දෙන පණිවුඩය කුමක්ද කියා

සිතිය යුතුයි. විශේෂයෙන්ම ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ප්‍රමුඛවයි අනෙකුත් සහෝදර පක්ෂ අප හා එක්ව සිටින්නේ, ශ්‍රී ලංකා නිදහස් පක්ෂ දේශපාලන දර්ශනය එස්.ඩබ්.ආර්.ඩී බණ්ඩාරනායක මැතිතුමා හඳුන්වා දුන් සමාජ ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලනයත් එක්කයි. පක්ෂයේ වසර 65ට ආසන්න කාලයක් ගෙවුණු මේ ඉතිහාසයේ අපි විදේශීය ආක්‍රමණයන්ට ලක්වෙලා තිබෙනවා. ඒ නිසා අපි දන්නවා යටත් විජිතවාදයේ ප්‍රතිඵල මොනවාද කියලා. ශ්‍රී ලංකා නිදහස් පක්ෂය සැමවිටම යටත් විජිතවාදයට විරුද්ධයි. අධිරාජ්‍යවාදයට විරුද්ධයි. රටක් දියුණු කරන්න රට තුළ ගෙනයන සංවර්ධන වැඩපිළිවෙළ වගේම එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තිය තුළින් අපේ රට ඉදිරියට ගෙන යාමට අප සැමවිටම කටයුතු කරනවා.

මැයි දිනය පිළිබඳව ප්‍රධාන වශයෙන් කතා කරනවිට එක්සත් ජාතීන්ගේ සංවිධානය 2016 වසර සඳහා ලෝක කම්කරු සංවිධානයේ එකඟත්වය ඇතිව තිරසර සංවර්ධනය පිළිබඳව ප්‍රකාශයක් නිකුත් කළා. ලෝක කම්කරු සංවිධානයේ අනුමැතිය ලබාගෙන තිබෙන මේ තුළ 08 වන යෝජනාව විදියට පැහැදිලිව සඳහන් කරලා තියෙනවා විශේෂයෙන්ම වැඩකරන ජනතාව පිළිබඳව ශිෂ්ට ශ්‍රමය සංකල්පය ලෝකයේ රාජ්‍යයන් වෙතින් පිළිගත යුතු ඒ සංකල්පය පැහැදිලි ලෙසම ශ්‍රී ලංකා රජය පිළිගන්නවා. ඒ තුළ විශේෂයෙන්ම සඳහන් වන්නේ ජනතාවගේ ශ්‍රමය යෙදවීම සඳහා සාධාරණ අවකාශයක් ලබාදීමයි. ඒ තුළින් අදහස් කරන්නේ ශ්‍රමය ලබාගැනීම අසාධාරණ ලෙස සිදු නොවිය යුතුයි කියන එක. අපි රාජ්‍ය ප්‍රතිපත්තිය තුළ ඒ එකඟත්වයෙන් වැඩ කරන්න බලාපොරොත්තු වෙනවා.

වෘත්තිය සමිති නායකයෙක් වන ලෙස්ලි දේවේන්ද්‍ර සහෝදරයා කරුණු රාශියක් ඉදිරිපත් කළා වැඩකරන ජනතාව පිළිබඳව. එක්සත් ජනතා නිදහස් සන්ධානය විදියට අපිට ජාතික වශයෙන් හා අන්තර්ජාතික වශයෙන් බලපාන්නා වූ යෝජනා 05 ක් මෙම වේදිකාවේ සම්මත කරනු

ලැබුවා. ඒ සියලු යෝජනා සහ ලෙස්ලි දේවේන්ද්‍ර සහෝදරයා ඉදිරිපත් කළ අදහසුත් ශ්‍රී ලංකා නිදහස් පක්ෂ සභාපතිවරයා ලෙසට හා මේ රටේ ජනාධිපතිවරයා විදියට මා ඉතාමත්ම ගෞරවයෙන් පිළිගන්නවා.

අපි ශ්‍රමය පිළිබඳව කතා කරනවිට 18 සියවසේ කම්කරුවා ලෙස හඳුන්වා දුන් ශ්‍රමය රටට ලබාදෙන පුද්ගලයා එදා කම්කරුවා විදියට කරන ලද නිර්වචනය අද නව තාක්ෂණයත් එක්ක සහ දේශපාලන පරිවර්තනත් එක්ක, සංවර්ධනයත් එක්ක බොහෝම වෙනස්කම්වලට භාජනය වෙලා තියෙනවා. එදා බොහෝ වෙලාවට කම්කරුවා විදියට හැඳින්වූයේ දහඩිය හෙළන කම්කරුවායි. පාරේ, කුඹුරේ, වැවිලි කර්මාන්තයේ ආදී කර්මාන්තයන්හි වැඩ කරන, අව්වට වේළෙමින් වැස්සට තෙමෙමින් වැඩ කරන පුද්ගලයා තමයි කම්කරුවා ලෙස හැඳින්වූයේ. නමුත් නව තාක්ෂණයත් සමග වෙනස් වූ සමාජයේ අද වැඩකරන කම්කරුවා කියලා කියන්නේ කාර්යාලයේ වැඩ කරන නිලධාරීන් ඇතුළු සියලුදෙනා. රට විදියට ගත්තාම වැඩ කරන ජනතාව කියලා කියන්නේ සියලු ක්ෂේත්‍රයන්හි වැඩ කරන ජනතාවයි. අපේ රට වෙනුවෙන් වෙනත් රටවලට ගිහින් අපට විදෙස් විනිමය සොයාදෙන ජනතාවත් කම්කරුවන් වෙනවා. ඒ විතරක් නොවේ අද තාක්ෂණය තුළ කාර්යාලය කම්හල, ආදී ස්ථානයන් තුළ රැඳී සිටින සෑම කෙනෙක්ම වැඩකරන ජනතාව කියලා අපි හොඳින් දන්නවා.

වැඩ කරන ජනතාවගේ අයිතිවාසිකම් හා වරප්‍රසාද ලබාදීම,පිළිගැනීම සහ ආරක්ෂා කිරීම ආණ්ඩුවක ප්‍රධාන වගකීම වෙනවා. ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ඒ ප්‍රතිපත්තිය පැහැදිලිවම පිළිගන්නවා. ඒ නිසා ඒ අනුව කටයුතු කිරීම අපි අනිවාර්යෙන්ම කරනවා. අපිට අපේ රටේ ප්‍රධාන වශයෙන්ම වැඩ කරන ජනතාවට බලපාන්න තිබුණ බොහෝ ප්‍රශ්න පසුගිය වසර කාල සීමාව තුළ බරපතළ ප්‍රශ්න විසඳගන්න පුළුවන් වුණා. ඔබ සෑම කෙනෙක්ම

රට විදියට ගත්තාම වැඩ කරන ජනතාව කියලා කියන්නේ සියලු ක්ෂේත්‍රයන්හි වැඩකරන ජනතාවයි.

**නිදහස හා ප්‍රජාතන්ත්‍රවාදය ශක්තිමත් කිරීම**

දන්නවා මීට වසර දෙකකට කලින් අපේ රටට යුරෝපා සංගමය ආර්ථික සම්බාධක දැමීමේ පළමු පියවර ලෙස මත්ස්‍ය වෙළෙඳාම නැවැත්වුවා. ඒ වගේම අපේ ඇඟලුම් කර්මාන්තය ඇතුළු කර්මාන්ත සඳහා ජී.එස්.පී සහනය ඉවත් කරනු ලැබුවා. අපිට පුළුවන්කම ලැබුණා පසුගිය සතියේ යුරෝපා සංගමයේ මසුන් අලෙවිය සමග තිබුණු තහනම ඉවත් කරගන්න, අද රාත්‍රියේ ගැසට් වෙනවා යුරෝපා සංගමයට අපේ ධීවර මත්ස්‍ය අලෙවිය නැවත ලබාදීම පිළිබඳව ගැසට් නිවේදනය. ඒ වගේම තමයි පසු දිනක අපට පැහැදිලිව වාර්තා වුණා අන්තර්ජාතික සංවිධානවලින්, යුරෝපා සංගමයෙන් ජී.එස්.පී සහනය ඉදිරි සති කිහිපය තුළ අපට ලැබෙන බවට.

ඒ නිසා අපි ආර්ථික වශයෙන් ශක්තිමත් වියයුතු රටක් විදියට ඒ සහනත් සමග නව වැඩපිළිවෙළකට යමින් දේශීය ආර්ථිකය ශක්තිමත් කරමින් අන්තර්ජාතික වශයෙන් අපේ රට ගොඩනගන්න සියලුදෙනාගේම සහාය ලබාගන්නවා. අපට නව තාක්ෂණය අවශ්‍යයි. අපට සංවර්ධනය සඳහා ආධාර අනුබල අවශ්‍යයි. අද ලෝකයේ සියලු රාජ්‍යයන් කිසිදු භේදයක් නැතිව අපට උදව් කරනවා. තව සති දෙකකින් ජපානයේ පැවැත්වෙනවා ජී-7 සමුළුව. ශ්‍රී ලංකා රජයට, රාජ්‍ය නායකයාට ඒ සඳහා ආරාධනා කළ පළමු අවස්ථාව මෙයයි. එහිදී මා විශ්වාස කරනවා ජී-7 කණ්ඩායමේ විශාල සහායක් අපේ රටේ ආර්ථිකය ගොඩනගන්න ලබාගන්න.

මේ රටේ දුප්පත්කම පරාජය කර ආර්ථික සමෘද්ධිය ඇති කරගත යුතුයි. ඒ තුළ ජනතාවගේ ජීවන තත්වය උසස් කිරීම සඳහා ගත හැකි සෑම පියවරක්ම ගන්නවා. ඒ කාර්යයේදී ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ප්‍රතිපත්ති සමග අනෙක් මිත්‍ර පක්ෂත් සමග එක්ව සන්ධාන රජයක් විදියට මහජනතාවගේ යහපත් අනාගතයක් සඳහා වැඩ කරන ජනතාවගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා, ඔවුන්ගේ වරප්‍රසාද ලබාදීම සඳහා අපි සැම විටම කටයුතු කරනවා.

ජනතාවට ලැබිය යුතු නිදහස හා ප්‍රජාතන්ත්‍රවාදය ශක්තිමත් කිරීම අපේ වගකීමක්. පසුගිය වසරේ 19 වැනි ව්‍යවස්ථා සංශෝධනයෙන් ඒ කාර්යය අපි ඉටු කරනු ලැබුවා. අපිට හොඳ රටක් හදන්න සියලු දෙනාගේ කැපවීම අවශ්‍යයි. වාදභේද, ජාති, ආගම්, භාෂා භේද නැතිව සියලු දෙනා එකට එකතුවිය යුතුයි. 2016 මහා මැයි රැලියේදී ගාලු පුරවරයේදී, මේ සමස්ත දේශපාලන පක්ෂවලට නායකයින්ට, වෘත්තීය සමිති ව්‍යාපාරයට රටේ ජනතාවගේ සුබසිද්ධිය ප්‍රාර්ථනා කරන සියලු දෙනාට කිසිදු පක්ෂ භේදයකින් තොරව මේ රට ගොඩනගන්න එකතු වන ලෙස මම දෑත් ඔසවා ආරාධනා කරනවා.

අපිට බෙදී වෙන්වී රටක් ගොඩනගන්න පුළුවන්කමක් නැහැ. අද අපිට තිබෙන්නේ සමගිව සුහදතාවයෙන් එකතුවීමයි. අපිට අභියෝග රාශියක් තිබෙනවා. අද අපේ ණය බර රුපියල් කෝටි අට ලක්ෂ පනස් දහසක් වෙනවා. ශ්‍රී ලංකා ගුවන් සේවය, මිහින් ලංකා ගුවන් සේවාවල පාඩුව කෝටි 8500 ක් වෙනවා. මේ විදිහට ඉතාම බරපතළ තත්ත්වයන් එක්ක මේ රට ගොඩනගන්න, ජනතාවට සමෘද්ධිමත් ආර්ථිකයක් ඇති කරන්න, මුළු රටම සහෝදරත්වයෙන් ඉදිරියට ගෙන යාමට මේ සෑම කෙනෙක්ම අපේ රට, අපේ මාතෘ භූමිය, අපේ ජනතාව කියන හැඟීමෙන් එන්න ඕනෑ.

අපි වසර 26ක් බරපතළ යුද්ධයකට මුහුණ දුන්නා. මේ රටේ උතුරෙන් හතළිස්, පනස්, ගණන්වල හැට ගණන්වලත් ෆෙඩරල් හඬක් ආවා. අපි සැලකිය යුත්තේ ෆෙඩරල් හඬ නොවේ. එවැනි හඬක් එන්නේ ඇයි කියන කාරණයයි අපි තෝරාබේරා ගත් යුත්තේ. අපි යුද්ධයකට මුහුණ දීමට සිදුවූ හේතුව සොයා බැලිය යුතුයි. ඒ නිසා මේ සියලු ප්‍රශ්නවලට විසඳුම් ලබාගෙන රට ඉදිරියට ගෙන යාමට සියලු දෙනාටම වගකීමක් තිබෙනවා.

**සෑම කෙනෙක්ම සහෝදරත්වයෙන් ජීවත්වන රටක්**

රට තුළ ජීවත් වන දමිළ, මුස්ලිම්, බෞද්ධ, කතෝලික, හින්දු, ඉස්ලාමීය මේ සෑම

**ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ඉදිරි අනාගතයේදී මේ රටේ ආණ්ඩුවක් හදන්න පිරිසිදු පක්ෂයක් ලෙස ගොඩනැගෙන්නට ඕනෑ.**

කෙනෙක්ම සහෝදරත්වයෙන් ජීවත්වන රටක් විදියට ශක්තිමත් ජාතික සංහිඳියා පිළිවෙතක් සමග මේ රටේ ආර්ථික සමෘද්ධිය ඇති කර රටේ ප්‍රජාතන්ත්‍රවාදය සහ නිදහස තහවුරු කර ඉතාම සුබවාදී රටක් හදන්න අපි සියලු දෙනා ඒකරාශි වෙමු.

අද දවසේ ඒ පණිවුඩය රටට දීමට ඔබ විශාල කැපවීමක් කර තිබෙනවා. මේ මැයි රැලිය සාර්ථක කරන්න ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ පාර්ලිමේන්තු, පළාත් සභා මැති ඇමති වරුන්, ප්‍රධානීන්, සංවිධායකවරු, ගාලු දිස්ත්‍රික්කයේ අපේ නායකයින් විශාල කැපවීමක් කර තිබෙනවා.

ලෙස්ලි සහෝදරයා, රන්ජිත් හෙට්ටිආරච්චි සහෝදරයා ඇතුළු ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ වෘත්තීය සමිති නායකයින් ඇතුළු වෘත්තීය සමිති ව්‍යාපාරවල පිරිස විශාල කැපවීමක් සහ පරිත්‍යාගයක් කර තිබෙනවා.

එක්සත් ජනතා නිදහස් සන්ධානයේ අපේ සහෝදර පක්ෂ මේ වේදිකාවේ ඉන්න මේ සඳහා විශාල සහයෝගයක් දී තිබෙනවා. එක්සත් ජනතා නිදහස් සන්ධානය විදියට මෙතෙක් වැඩ නොකළ විශාල සංවිධාන රාශියක් අද අපිත් එක්ක එකතුවෙලා වැඩ කරන්න මේ වේදිකාවට ඇවිත් ඉන්නවා. ඒ සියලු දෙනා මම ඉතා ගෞරවයෙන් පිළිගන්නවා. මේ වියළි කාලගුණයෙන් පසුව ඇදහැළුනු මහා ධාරාණිපාත වර්ෂාවට මුහුණ දී මේ ආදරණීය ජනතාව මේ මැයි රැලිය සාර්ථක කරන්න ඔබ කළ කැපවීමට මගේ ස්තුතිය පිරිනමනවා. හොඳ දේශපාලන ව්‍යාපාරයක් ගොඩනැගීමට යන ගමනට අද මේ ජනතාව ලබාදුන්න සහයෝගය ඉතා විශිෂ්ටයි.

ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ඉදිරි අනාගතයේදී මේ රටේ ආණ්ඩුවක් හදන්න පිරිසිදු පක්ෂයක් ලෙස ගොඩනැගෙන්නට ඕනෑ. ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ශක්තිමත් විය යුත්තේ ගුණාත්මකභාවයෙනුයි. දේශපාලන ව්‍යාපාර ගෙන යන විට ජනතාවාදී ලෙස ප්‍රජාතන්ත්‍රවාදී ලෙස ගෙන යා යුතුයි. ලෝකයේ විශිෂ්ට ප්‍රජාතන්ත්‍රවාදී නායකයින් මානවවාදය තුළ ඉතා පිරිසිදු දේශපාලන නාමයන් ගොඩනගාගෙන තිබෙනවා.

එදා කාල් මාක්ස් ලා, ලෙනින් ලා, මාවෝ සේතුං ලා මානව සමාජයට ආදර්ශයක් දුන්නා ශිෂ්ට සම්පන්නව යහපත් දේශපාලන ව්‍යාපාර ගොඩනගන්නේ කොහොමද කියලා. මෑත භාගයේ ගත්විට ඇමරිකාවේ ඒබ්‍රහම් ලින්කන් ලා, ඉන්දියාවේ මහත්මා ගාන්ධිතුමාලා, දකුණු අප්‍රිකාවේ නෙල්සන් මැන්ඩෙලා, ලංකාවේ එස්.ඩබ්.ආර්.ඩී. බණ්ඩාරනායක මැතිතුමා වැනි නායකයින් ගුණාත්මක දේශපාලනයක්, පිරිසිදු දේශපාලනයක් පිළිබඳ ලෝකයට ඒ මඟ පෙන්වීම කර තිබෙනවා.

දූෂණය, වංචාව තුරන් කර අවංකව කැපවීම දේශපාලන ව්‍යාපාරයක නායකයෙකු තුළ තිබිය යුතු ලක්ෂණයක් වෙනවා. මේ රට හොඳ රටක් කරන්න, හොඳ ආණ්ඩුවක් හදන්න පුළුවන් වෙන්නේ පිරිසිදු ගුණාත්මක මානවවාදී ශිෂ්ටසම්පන්න, විනයගරුක දේශපාලන ව්‍යාපාරයක් ගොඩනැගීමෙනුයි. එය ඔබ අප සෑම කෙනෙක්ම පිළිගන්නා වූ දෙයක්.

ඒ නිසා මම විශ්වාස කරනවා ශ්‍රී ලංකා නිදහස් පක්ෂය පසුගිය ජාතික මැතිවරණ දෙකකදී පරාජයට පත්වුණා. නමුත් අනාගතයේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ගුණාත්මක දේශපාලන ව්‍යාපාරයක් සඳහා පැහැදිලි පිරිසිදු මානවවාදී දේශපාලන ව්‍යාපාරයක් ශක්තිමත් ලෙස ගොඩනගන්න මේ මහා මැයි රැලිය අද මුල් අඩිතාලම දැම්මයි කියන එක මා විශ්වාස කරනවා. මෙතැනින් එහාට මේ පක්ෂය ශක්තිමත් කරගෙන අපි වේගවත් ගමනකින් ඉදිරියට යන බව මේ අවස්ථාවේදී ප්‍රකාශ කරන්නට ඕනෑ.

මම ඔබේ සේවකයෙක් විදියට ඔබ වෙනුවෙන් කළ හැකි සියලු පරිත්‍යාගයන් මාතෘභූමිය වෙනුවෙන් කරමින් මේ රට ගොඩනගන්න, ලස්සන රටක් හදන්න, විනයගරුක රටක් හදන්න. ශිෂ්ට සම්පන්න රටක් හදන්න, ලෝකයේ අනෙකුත් රටවලට ආදර්ශමත් රටක් ලෙස ගොඩනගන්න ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ප්‍රමුඛ එක්සත් ජනතා නිදහස් සන්ධානයේ සියලු කැපවීම් නොබියව ඉටු කරනවයි කියන ප්‍රතිඥාව දෙමින් ඔබ සියලු දෙනාට ජයවේවා! කියා මා ප්‍රාර්ථනා කරනවා.

අපේ උතුම් මාතෘ භූමියට ජයවේවා!. වැඩ කරන ජනතාවට ජයවේවා!!.

ගාල්ල සමනල ක්‍රීඩාංගණයේ පැවැති
මැයි දින රැලිය අමතමින් ජනාධිපතිතුමා කළ කතාව



# පංති සටන

**මේ බලය, ජවය, ශක්තිය කාගේද ?**

ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ 65 වෙනි සංවත්සර උළෙල අදයි. රටේ කිසිවෙක් බලාපොරොත්තු නොවූ ආකාරයට අතිවිශාල ජන ගංගාවක් අද මෙම ස්ථානයට පැමිණ තිබෙනවා. මේ ක්‍රීඩාංගණය තුළ සිටින ජනතාවට වඩා වැඩි ජනතාවක් එන්න බැරුව එළියේ හිරවෙලා කුරුණෑගල නගරයේ සිටින බව පොලිසිය වාර්තා කර තිබෙනවා.

මිත්‍රවරුනි, දෙමාපියනි, දරුවනි මේ ශක්තිය කාගේද, මේ බලය කාගේද, මේ ජවය කාගේද, මේ ශක්තිය ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ශක්තියයි. මේ බලය ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ බලයයි. මේ ජවය ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ජවයයි. මෙයට අභියෝග කරන්න මේ රටේ කිසිදු දේශපාලන බලවේගයකට හෝ ප්‍රතිවාදී බලවේගයකට නොහැකියි කියන එක මම මුළු රටටම හඬනගා කියන්නට කැමතියි. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට කීර්තිමත් ඉතිහාසයක් තිබෙනවා. ඒ

**මේ රටේ ජනතාවට අපේම රටක් අවශ්‍ය වුණා**

කීර්තිමත් ඉතිහාසයේ ශ්‍රේෂ්ඨ කතාවක් තිබෙනවා. ඒ ශ්‍රේෂ්ඨ කතාවේ රසමුසු තැන් මෙන්ම දුක්මුසු තැන් සහ දුක්ගැහැට සහ අභියෝගාත්මක අවස්ථා රැසක් තිබෙනවා.

එස්.ඩබ්ලිව්.ආර්.ඩී බණ්ඩාරනායක මැතිතුමා ශ්‍රී ලංකා නිදහස් පක්ෂය හැදුවේ ඇයි. සමහර අය කියනවා බණ්ඩාරනායක මැතිතුමා එක්සත් ජාතික පක්ෂයේ ඉඳලා එක්සත් ජාතික පක්ෂය කඩාගෙන ඇවිල්ලා ශ්‍රී ලංකා නිදහස් පක්ෂය හැදුවා කියලා. මම කියවලා තිබෙන පොතපතේ හැටියට නම් ඊට එකඟවන්න බැහැ.

එදා ඒ යුගයට අවශ්‍ය රටේ සටන් පාඨ ගණනාවක් තිබුණා. ඒ සටන් පාඨ අතට ගත් පිරිසක් හිටියා. සිංහල මහ සභාවත් එක්ක ඒ යුගයේ සටන් පාඨ අතට ගත්තේ කවුද. බ්‍රිතාන්‍ය පාලනයට යටත්වෙලා හිටපු අපි 1505 සිට 1948 වනතුරු අප සිටියේ විදේශිකයින්ගේ පාලනයට යටත් වෙලා. 1948 දී අප නිදහස ලබාගත්තට පස්සේ මේ රටේ ජනතාවට අපේම රටක් අවශ්‍ය වුණා. ස්වාධිපත්‍ය සහිත ස්වදේශිකත්වයට මුල් තැන දෙන ස්වාධීන වූ අපේම රටක් පිළිබඳ අපේක්ෂාව ඒ තුළ මූලික වුණා.

ඒ මගින් පිළිබිඹු වූයේ අපේ සංස්කෘතිය හා ශිෂ්ටාචාරය මත ගොඩනැඟුණු රටක් තුළ අපේම ආණ්ඩුවක අවශ්‍යතාවයයි. බ්‍රිතාන්‍ය පාලනයට විරුද්ධව මතු වූ නිදහස් අරගලය තුළ එම අපේක්ෂාව මතු කරමින් ජයග්‍රහණය සඳහා අවසන් මොහොත දක්වාම සටන් කරනු ලැබුවේ එම ජනතාව නියෝජනය කරන සිංහල, දෙමළ, මුස්ලිම් නායකයින්ය යන්න අමතක කරන්න එපා.

1951 සැප්තැම්බර් 02 වෙනිදා බණ්ඩාරනායක මැතිතුමා ශ්‍රී ලංකා නිදහස් පක්ෂය බිහි කරන විට එදා මැතිවරණ කොමසාරිස්වරයා

සතුව පැවැති නීතිරීති අනුව පක්ෂයට ප්‍රධාන ලේකම්වරයෙකුගේ අවශ්‍යතාවය තිබුණේ නැහැ. සම ලේකම්වරු පත් කරන්න නීතිමය වශයෙන් නම්‍යතාවයක් තිබුණා. ඒ නිසා බණ්ඩාරනායක මැතිතුමා පක්ෂයේ පළමුවෙනි නිලධාරි මණ්ඩලය ලෙස සම ලේකම්වරු තුන් දෙනෙක් පත් කළා.

ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට ආණ්ඩුවක් හදන්න ඒ යුගයට අදාළව ගොඩනැගුණු සාධක ගණනාවක් තිබුණා. ගමේ පන්සලේ හාමුදුරුවෝ, කුඹුරේ ගොවි මහත්තයා, කර්මාන්ත ශාලාවේ කම්කරුවා, ගමේ වෙද මහත්තයා, ගමේ ඉස්කෝලේ මහත්තයා නියෝජනය කළ පංච මහා බලවේගය එහිදී පෙරමුණ ගනු ලැබුවා. මාර්ටින් වික්‍රමසිංහ වැනි මහා සාහිත්‍යධරයන්, පී.බී. අල්විස් පෙරේරා වැනි කවීන් ඒ සඳහා දායක වී තිබෙනවා. ඒ අනුව පෙනී යන්නේ එදා පැවැති දේශපාලන බලවේගවලට සමාන්තරව 56 දී ආණ්ඩුවක් හදන්න පෙරමුණ ගෙන ඇත්තේ මේ රටේ සංස්කෘතික බලවේග වන බවයි. ඒ මතයි දේශපාලන වේදිකාව සකස් වුණේ.

1956 දී බණ්ඩාරනායක මහත්තයා පක්ෂය හැදුවා. අනතුරුව 56 දී එළැඹි පළමු මැතිවරණයේදීම ආසන 09 ක් ජයග්‍රහණය කළා. 1956 මහජන එක්සත් පෙරමුණ කේන්ද්‍රගත කර ගනිමින් ආණ්ඩුවක් හැදුවා. ලංකාවේ දේශපාලන නායකයෙක් පක්ෂයක් හදලා අඩුම කාලයකින් ආණ්ඩුවක් හැදුවේ එස්.ඩබ්ලිව්.ආර්.ඩී බණ්ඩාරනායක මැතිතුමා. ඒ ආණ්ඩුවට මිනිස්සු කිව්වේ අපේ ආණ්ඩුව කියලා. ලැබූ ජයග්‍රහණයෙන් පස්සේ පාර්ලිමේන්තුව නරඹන්න පාර්ලිමේන්තුව ඇතුළට ගිය සාමාන්‍ය ජනතාව මන්ත්‍රීවරුන් ඉඳගන්න පුටුව අතගාලා කිව්වේ මේ අපේ මැති ඇමැතිවරු ඉඳගන්න පුටු කියලා. එදා මේ රටේ සාමාන්‍ය ජනතාව 56 ජයග්‍රහණය උද්දාමයෙන් හා අභිමානයෙන් පිළිගත්තේ ඒ ආකාරයෙන්. ඔවුන් එදා අපේක්ෂා කළ ඒ සමාජ, සංස්කෘතික හා ආර්ථික

ඒ ආණ්ඩුවට මිනිස්සු කිව්වේ අපේ ආණ්ඩුව කියලා.

**බණ්ඩාරනායක මැතිතුමා කළ වෙනස්කම්**

වෙනස ආරම්භ වූයේ එලෙසයි. ශ්‍රී ලංකා නිදහස් පක්ෂය යනු ස්වදේශිකත්වය මුල් කරගත් අපේ සංස්කෘතිය, අපේ ශිෂ්ටාචාරය මත පදනම් වූ අපේම දේශපාලන පක්ෂයයි. ඒ 56 ආණ්ඩුව රටට අවශ්‍ය වෙනස්කම් රාශියක් කළා. මම හැමදාම කියන දෙයක් තිබෙනවා, එනම් මේ රටේ බලයට පත්වූ නායකයින්ගෙන් බලයේ සිටින කාලය තුළදී බණ්ඩාරනායක මැතිතුමා තරම් මානසික වද වේදනාවන්ට ලක් වූ නායකයෙක් තවත් නැති බව. වැඩ වර්ජන, පක්ෂයේ අභ්‍යන්තර ආරවුල්, ආණ්ඩුවේ ආරවුල්, කැබිනට් මණ්ඩලයේ වර්ජන යන මේ සියල්ල සමග බණ්ඩාරනාක මැතිතුමා බරපතල අර්බුද රාශියකට මුහුණ දුන්නා. ඒ අර්බුද කොතෙක් ආවත් පිටකොන්දක් ඇති දේශප්‍රේමී දේශපාලන නායකයෙක් ලෙස ජාතික සහ ජාත්‍යන්තර ප්‍රශ්නවලට මුහුණදීලා රටට කළයුතු වෙනස්කම ඒ අවුරුදු තුන හමාරේ දී ඉටු කරනු ලැබුවා.

මේ රටේ දේශපාලනඥයින් ඉන්නවා බලයේ දීර්ඝ කාලයක් සිටි අය. බණ්ඩාරනායක මැතිතුමා කියලා කියන්නේ ඉතාම අඩුම කාලයක් බලයේ සිටි රාජ්‍ය නායකයායි. නමුත් මේ රටේ පොදු මහජනතාවගේ, වැඩ කරන පංතියේ, කම්කරුවාගේ, ගොවියාගේ ගමේ පන්සලේ හාමුදුරුවන්ගේ, ඉස්කෝලේ මහත්තයාගේ, මේ රටේ පුංචි මිනිසුන්ගේ හදවතේ අදත් ජීවමානව පවතින්නේ බණ්ඩාරනායක ශ්‍රීමතාණන්ගේ නාමයයි. ශ්‍රී ලංකා නිදහස් පක්ෂය අදත් බැබළෙන්නේ ඇතැමුන් දගලන්නේ නළියන්නේ, හඬගගන්නේ ඒ බණ්ඩාරනායක මැතිතුමා කරපු වෙනස්කම් නිසා කියන එක අමතක කරන්න එපා. මේ පක්ෂය පවිත්‍ර පක්ෂයක්. නිර්මල පක්ෂයක්, මේ පක්ෂය රට කර වූ පක්ෂයක්. රට කරවිය යුතු පක්ෂයක්. නිදහසින් පසුව ලංකාවේ වැඩිම කාලයක් රාජ්‍ය පාලනයේ යෙදී සිටින්නේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ නායකත්වයයි කියන එක අමතක කරන්න බැහැ.

ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සමාජ න්‍යායාත්මක පදනම සමාජ ප්‍රජාතන්ත්‍රවාදයයි. සමාජ ප්‍රජාතන්ත්‍රවාදය කියන්නේ කුමක්ද, විශේෂයෙන්ම පොදු ජනතා සුබසාධනය, පොදු ජන මෙහෙවර, පුංචි මිනිසුන් වෙනුවෙන් පෙනී සිටීම, රටේ ප්‍රජාතන්ත්‍රවාදය තහවුරු කිරීම. නිදහස තහවුරු කිරීම, සැබෑ ලෙස පුංචි මිනිසාගේ අයිතිය වෙනුවෙන් පෙනී සිටිමින් ඒ අවශ්‍ය සමාජ, ආර්ථික හා දේශපාලන වෙනස්කම් කිරීම. එහෙමනම් මේ පක්ෂය අපි ශක්තිමත් කිරීම අවශ්‍යයි. අදට ගැළපෙන ආකාරයට සකස් කිරීම අවශ්‍යයි.

එහෙත් අවසානයේ පක්ෂයේ පළමුවෙනි නායකයා අමු අමුවේ වෙඩි තියලා මරලා දැම්මා. පසුව සිරිමාවෝ බණ්ඩාරනායක මැතිණිය මේ පක්ෂයට අවශ්‍ය නායකත්වය දීලා ඒ යුගය තුළ කළයුතු වෙනස්කම් කළා. එහි ප්‍රතිඵලය වුණේ කුමක්ද, පක්ෂයේ දෙවෙනි නායිකාව සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනියගේ ප්‍රජා අයිතිය අහෝසි කරලා දේශපාලනයෙන් ඉවත් කරන්න උත්සාහ කළා. පසුව එය ආපස්සට හරවා බණ්ඩාරනායක මැතිනියට යුක්තිය ඉටු කරන්න අපට හැකි වුණා. පක්ෂයේ තුන්වෙනි නායිකාව චන්ද්‍රිකා කුමාරතුංග මැතිනිය යුද්ධයට මුහුණ දීලා ආබාධිත වුණා. පක්ෂයේ හතර වන නායකයා මහින්ද රාජපක්ෂ මහත්තයා යුද ජයග්‍රහණයට දේශපාලන නායකත්වය දුන්නා. අපි සියලුදෙනා එකට එකතුවෙලා ඒ යුද ජයග්‍රහණය ලබා ගත්තා. පක්ෂයේ පස්වන නායකයා විදියට අද මා කටයුතු කරනවා.

මම පක්ෂයේ නායකත්වය භාරගත්තේ ඒ සඳහා මට කරන ලද ආරාධනය අනුවයි. මම ආණ්ඩුවෙන් එළියට ගිහිල්ලා පොදු අපේක්ෂකයා විදියට පෙනී සිටියේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ලේකම් විදියට. පොදු අපේක්ෂකයා විදියට මා සමග සම්මුතියකට එළැඹි පක්ෂ හා සංවිධාන 49ක් අතර එක්සත් ජාතික පක්ෂය ප්‍රමුඛව සිටියා. ඔවුන් මාත් එක්ක ගිවිසුමක් අත්සන් කළේ නැහැ ඔබ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයෙන් ඉවත්

**ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට එරෙහිව ගිවිසුම් අත්සන් කළේ නැත**

**ශ්‍රී ලංකා නිදහස් පක්ෂය භාරගත්තේ ඉපිලී ගිය ප්‍රීතියෙන් හා අභිමානයෙන්**

විය යුතුයි කියලා. ඔබ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට නැවත නොයා යුතුයි කියලා ගිවිසුමක් අත්සන් කළේ නැහැ. ඒක මගේ මානව හිමිකමක් වගේම මූලික අයිතිවාසිකමක්. ඒ ගැන කිසිදු බාධාවක් ඇතිවුණේ නැහැ.

2015 ජනවාරි 09 වෙනිදා ජනාධිපතිවරයා විදියට දිවුරුම් දීලා දවස් තුනකට පස්සේ පක්ෂයේ සභාපතිකම භාරගන්න කියලා මට ආරාධනා කළ අවස්ථාවේ මම පුදුම වුණා. නමුත් මම හරිම සතුටින්, ඉපිලී ගිය ප්‍රීතියකින් සහ අභිමානයකින් එදා පක්ෂය භාර ගත්තා. එදා මම මේ පක්ෂය භාරගත්තේ නැවත මේ රටේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂ ආණ්ඩුවක් ගොඩනැඟීම සඳහායි කියන එක පැහැදිලිව තමුන්නාන්සේලාට කියන්න ඕන.

එක්සත් ජාතික පක්ෂය ප්‍රමුඛ දේශපාලන පක්ෂ ගණනාවක් මාව ජනාධිපති අපේක්ෂකයා කරලා ජනාධිපතිවරයා විදියට ජයග්‍රහණය කළ විට අපි පොදු එකඟතාවයක්, සම්මුතියක් ඇති කරගත්තා, රටට පොදු ප්‍රකාශයක් ලබා දුන්නා රට වෙනුවෙන් ඉටු කරන්න. ඒ පොදු ප්‍රකාශයේ කිව්වා රට බරපතළ ප්‍රශ්න රාශියකට මුහුණ දීලා තිබෙනවා, මෙයින් රට ගොඩගන්න ඕන. ඒකට පාර්ලිමේන්තුවේ සියලු දේශපාලන පක්ෂ එකට එකතුවෙලා ආණ්ඩුවක් හදන්න ඕන කියලා. ඒ මැතිවරණ ප්‍රකාශය අනුව තමයි මට ජයග්‍රහණය ලැබුණේ. ගිය අවුරුද්දේ අගෝස්තු මාසේ 17 වෙනිදා මහ මැතිවරණයක් තිබ්බා. මේ රටේ ජනතාව ප්‍රධාන දේශපාලන පක්ෂ එකකටවත් ආණ්ඩුවක් හැදීමේ තනි අයිතියක් දුන්නේ නැහැ. ඒ අනුව මැතිවරණ ප්‍රකාශනයේ තිබුණත්, නැතත් ජනාධිපතිවරයා විදියට මට බලවත් වගකීම් තිබුණා රට අව්චාරවත් නොවිය යුතුයි, රාජ්‍යයේ පැවැත්ම තිබිය යුතුයි, රටට සහ ජනතාවට මා වගකිව යුතුයි, ඒ නිසා සියලුදෙනා එකට එකතුවෙලා ආණ්ඩුවක් හැදුවා. අද අපි ආණ්ඩු කරනවා. නමුත් සමහරුන් තුළ නොයෙකුත් විවේචන තිබෙනවා.

එක්සත් ජාතීන්ගේ මහලේකම් බෑන් කී මූන් මහතා මේ සතියේ ලංකාවට එන්න කලින් ආවේ 2009 මැයි මාසයේ දී. ඒ යුද්ධය අවසන් වූ විගසමයි. එදා බැන් කී මූන් මහත්තයා ඇවිල්ලා බලලා ගියා. ඊට පස්සේ තමුන්නාන්සේලා දන්නවා ඇතිවුණ ප්‍රශ්න. අපි නිසා ලෝකය බෙදුනා. අපි නිසා එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කොමිෂන් සභාව දෙකට බෙදුනා. එක්සත් ජාතීන්ගේ සංවිධානය සහ මානව හිමිකම් කොමිෂන් සභාව පවත්වපු ඡන්ද ගණනාවකින් අපේ රට පරාජයට පත් වුණා.

ඒ පරාජයට පත්වීමත් එක්ක ජාත්‍යන්තරයෙන් අපිට යෝජනා සහ චෝදනා මාලාවක් එල්ල කෙරුවා. ඔබලා යුද්ධය කෙරුවා. එහිදී මානව හිමිකම් කඩකෙරුවා කියලා. අපි එහිදී රටක් සහ රාජ්‍යයක් විදියට පෙනී සිටිය යුතු වෙනවා. ඒ පෙනී සිටීම රට වෙනුවෙන්, රටේ ජනතාව වෙනුවෙන් සහ මේ රටේ යුද්ධය කරපු යුද, නාවික. ගුවන් ත්‍රිවිධ හමුදාවේ සහ පොලීසියේ රණවිරුවන් වෙනුවෙන් පෙනී සිටිය යුත්තක් කියන එක අමතක කරන්න එපා.

අපි එම යෝජනාවලට අනිවාර්යයෙන්ම මුහුණදිය යුතු වුණා. එක පැත්තකින් රටට අවශ්‍ය නිදහස, ප්‍රජාතන්ත්‍රවාදය, මානව හිමිකම් සහ මූලික අයිතිවාසිකම්, රටේ ජනතාවට බියක්, සැකක් නැතුව සතුටින් ඉන්න පුළුවන් රටක්, සමාජයක් හදන්න අවශ්‍ය වුණා. රටේ සිංහල, මුස්ලිම්, දමිළ සියලු ජන කොටස්වලට විශ්වාසයෙන්, මිත්‍රත්වයෙන්, සහෝදරත්වයෙන් ජීවත්වෙන්න පුළුවන් රටක් හදන්න අවශ්‍ය වුණා. 30 දශකයේ 40 දශකයේ 50 සහ 60 දශකයේ සිට කෑගහපු අය ගැන අපට මතකයි. ඒ තුළ වරින් වර කලකෝලාහල මතු වුණා. අවසානයේ සිංහල, දමිළ ජනතාවගේ හඬ අරගලයක් බවට පත්වුණා. අවසානයේ මහා යුද බේදවාචකයක් ඇති වුණා. අපට යුද්ධයකට මුහුණ දෙන්න සිද්ධ වුණා. තිස් අවුරුද්දකට අධික කාලයක් අප යුද්ධ කෙරුවා. අවසානයේ අපට ප්‍රශ්න මාලාවක් ආවා. මේ

**අපේ හඬ ඇහුවේ නැහැ මැතිවරණයට ගියා**

**මැතිවරණ ජයග්‍රහණය ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ලේකම්වරයා අතට ගත්ත එක වැරදිද?**

ප්‍රශ්න මාලාවෙන් රට බේරාගැනීම අවශ්‍ය වුණා. 2014 ජනාධිපතිවරණයක් සඳහා ජනාධිපති මහින්ද රාජපක්ෂ මහත්තයා සූදානම් වන විට, මම මහින්ද රාජපක්ෂ මහත්තයට මගේම අතින් ලියලා විශේෂ ලියුමක් දුන්නා ජනාධිපතිවරණයක් තියන්න එපා කියලා. ආණ්ඩුව වෙනස්වන මැතිවරණයකට යන්න එපා කියලා. මිත්‍රවරුනි මට පක්ෂය පරාජය කරන්න අවශ්‍යනම්, මට ඒ ආණ්ඩුව පරාජය කිරීමේ අවශ්‍යතාවය තිබුණා නම් මම එසේ ලියුමක් ලියනවද කියලා මම ඔබෙන් අහනවා.

මේ වේදිකාවේ ඉන්න මැති ඇමැතිවරු, ජ්‍යෙෂ්ඨයින් සියලුදෙනා ඒ බව දන්නවා. මහින්ද රාජපක්ෂ මහත්තයට ලියුම ලියලා පක්ෂයේ ප්‍රධානීන්ට පිටපත ගානේ දුන්නා, එක මේසේ වාඩිවෙලා ආණ්ඩුවේ කැබිනට් මණ්ඩලය සාකච්ඡා කළා. ඡන්දයකට යන්න බැහැ, ජයග්‍රහණය කරන්න පුළුවන් පසුබිමක් නැහැ කියලා. ආණ්ඩුවේ පාර්ලිමේන්තු කණ්ඩායම පාර්ලිමේන්තුවේදී හමුවුණාහම කියනවා ඡන්දයකට යන්න බැහැ, ජයග්‍රහණය කරන්න පසුබිමක් නැහැ කියලා. නමුත් අපේ හඬ ඇහුවේ නැහැ. මැතිවරණයකට ගියා. එහෙමනම් ඒ පවත්වපු මැතිවරණයේදී ලබන ජයග්‍රහණය ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ලේකම්වරයාගේ අතට ගත්ත එක වැරදිද කියලා මම තමුන්නාන්සේලාගෙන් අහනවා.

අපි සම්මුතිවාදී ආණ්ඩුවක්. මේ රටේ ආණ්ඩු වෙනස් වුණාහම ඇතිවන තත්තවයන්, පශ්චාත් තත්ත්වයන් තමුන්නාන්සේලා දන්නවා. නමුත් අද අපි සංහිඳියාව ගැන කතා කරනකොට සිංහල, දමිළ, මුස්ලිම්, මැලේ, බර්ගර් ජාතින් අතර සංහිඳියාව පමණක් නොව දේශපාලන පක්ෂ අතරත් සංහිඳියාවක් තිබිය යුතුයි. ලෝකයේ දියුණු රටවල්වල, සංවර්ධනය වූ රටවල්වල ඒ දේශපාලන සංස්කෘතියේ වැදගත් කොටස් අප ආදර්ශයට ගත යුතු වෙනවා.

ඒ නිසා අපිට ස්වදේශිකත්වය පදනම් කරගෙන ඒ සියල්ල සමග ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ගොඩනැඟීමට අවශ්‍යයි. ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ගොඩනැඟීමේදී අපේ මූලික ප්‍රතිපත්ති, දර්ශනය අබ පියල්ලකින්වත් වෙනස් නොවිය යුතුයි.

සමාජ ප්‍රජාතන්ත්‍රවාදය ගැන අපට ගරුත්වයක් තිබෙනවා. විශේෂයෙන්ම වෙළෙඳපොළ ආර්ථිකයේදී, වෙළෙඳපොළ තරගකාරිත්වය තුළ විසි වෙන්නේ පුංචි මිනිසා, දුප්පත් මිනිසා කියන එක අපට අමතක කරන්න පුළුවන්කමක් නැහැ. අද පවත්නා වෙළෙඳපොළ ආර්ථිකයේ දී ඇතිවන තරගකාරිත්වයත් එක්ක කම්කරුවා, ගොවියා, පීඩිත පන්තිය, දුප්පතා වෙනුවෙන් පෙනී සිටිය හැකි දේශපාලන බලවේගයක් තිබිය යුතුයි. ශ්‍රී ලංකා නිදහස් පක්ෂය තවදුරටත් ශක්තිමත් කළ යුත්තේ ඒ නිසයි.

නිදහස, ප්‍රජාතන්ත්‍රවාදය, මානව හිමිකම්, මූලික අයිතිවාසිකම් තිබිය යුත්තේ ධනපති පන්තියට සහ වරප්‍රාසද ලත් පිරිසට පමණක් නොව, නැති බැරි, දුගී දුප්පත් සමස්ත ජනතාවට එක හා සමානව ඒ වරප්‍රසාද තිබිය යුතුයි. අපි ඒ ක්‍රමයට යා යුතු වෙනවා.

ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට නව ජවයකින්, නව වැඩපිළිවෙළකින් සහ සැලසුමකින් අලුත් ගමනක අවශ්‍යතාවය ඇතිවෙලා තිබෙනවා. මේ 65 වන සංවත්සර මහා සමුළුවේදී මේ පැමිණි අතිවිශාල මහ ජන ගංගාවට ආදරණීය දෙමාපියන්ට, දරුවන්ට මම කියනවා පක්ෂයේ සියලු නායකයින්ට මම කියනවා, අනාගතයේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂ ආණ්ඩුවක් පිහිටුවීමේ පළමුවෙනි වෙඩි මුරය තමයි අද මේ 65 වන සංවත්සර උත්සවය මගින් තබනු ලැබුවේ. ඒ බව මම පැහැදිලිවම තමුන්නාන්සේලාට කියනවා.

**අනාගත ශ්‍රී ල.නි.ප. ආණ්ඩුවක් හැදීමට එකතුවන්න.**

ලබන වසරේ මුල්භාගය වන විට පළාත් පාලන මැතිවරණ එනවා. දිවයිනේ සියලු පළාත් පාලන

**ඇයි මට ගහන්නේ මම පුංචි මිනිහෙක් නිසාද?**

මැතිවරණවලට අපි ශ්‍රී ලංකා නිදහස් පක්ෂය අත ලකුණෙන් තරග කරනවා. ඒ පළාත් පාලන මැතිවරණය සඳහා ශ්‍රී ලංකා නිදහස් පක්ෂය හා අපි එක්ක එකතුවෙලා ඉන්න. ඒ වගේම එකතුවෙන අනෙක් සහෝදර පක්ෂ, වාම ප්‍රගතිශීලී පක්ෂ ඒ සියල්ලටම ආරාධනා කරනවා එම පළාත් පාලන මැතිවරණ ජයග්‍රහණය කරන්න ශ්‍රී ලංකා නිදහස් පක්ෂ කොඩිය වටා ඒකරාශි වෙන්න කියලා.

ශ්‍රී ලංකා නිදහස් පක්ෂයෙන් පාර්ලිමේන්තුවට ගිහිල්ලා විපක්ෂ මන්ත්‍රීවරුන් විදියට ඉන්න ඕනේ කියලා කියපුවහම මම ඒ අයිතිය දුන්න පිරිසට මම කාරුණිකව සහ ගෞරවයෙන් ඉල්ලීමක් කරනවා අලුත් දේශපාලන බලවේග ගැන කතා නොකර ශ්‍රී ලංකා නිදහස් පක්ෂය සමග සිටගෙන, ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ශක්තිමත් කර අනාගතයේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂ ආණ්ඩුවක් හදන්න එක්වන ලෙස.

මේ පක්ෂය පිරිසිදු වෙන්න ඕන. මේ පක්ෂය නිර්මල වෙන්න ඕන. වැඩ කරන මිනිස්සු හෘද සාක්ෂියට අනුව වැඩ කරන්න ඕන. පුංචි මිනිසාගේ දුක තේරුම්ගන්න ඕන. මහ පොළොවේ අඩිය ගහලා යන්න ඕන, මේ පක්ෂය නියෝජනය කරන්නේ පොඩි මිනිසුන් කියන එක හැම අවස්ථාවකම අපි තේරුම්ගන්න ඕන.

අපි කොච්චර පැරදීලා තිබෙනවද, ශ්‍රී ලංකා නිදහස් පක්ෂය 60 මාර්තු මාසයේ පැරදුණා. ශ්‍රී ලංකා නිදහස් පක්ෂය 65 මැතිවරණයේ දී පැරදුණා. 77 පැරදුණා. ශ්‍රී ලංකා නිදහස් පක්ෂය 82 ජනාධිපතිවරණය පැරදුණා. 89 ජනාධිපතිවරණය පැරදුණා. 2001 පාර්ලිමේන්තු මැතිවරණයේදී පැරදුණා.

ජයග්‍රහණ පිළිබඳ කතා කරනවා වගේම පරාජය පිළිබඳවත් අපි කතා කරන්න ඕන. පක්ෂයක් කළයුතු දේ කුමක්දැයි කියා තේරුම් ගැනීම

අවශ්‍යයි. ඒ වගේම පක්ෂ නායකයින් කළයුතු දේ කුමක්දැයි කියා තේරුම් ගැනීම ද අවශ්‍යයි. ඒ සමගම පක්ෂයක් සහ පක්ෂ නායකයින් නොකළ යුතු දේ කුමක්දැයි තේරුම් ගැනීම ද අත්‍යවශ්‍ය වෙනවා.

එහෙමනම් පරාජයට හේතු වන නොකළ යුතු දේ අප විසින් නොකළ යුතුයි. ජයග්‍රහණයට හේතුවන කළයුතු දේ පක්ෂයක් සහ නායකයින් විදියට අප සියලුදෙනා කළ යුතුයි. මේක පොඩි මිනිසාගේ පක්ෂය. මේ රටේ දේශීය චින්තනය, අපේකම, දේශීයත්වය මේ සියල්ල වෙනුවෙන් පෙනී සිටින්නේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයයි.

සමහර අය මට එළිපිට ගහනවා, සමහර අය මට රහසේ ගහනවා. සමහර අය විවෘතව ගහනවා. සමහර අය අභ්‍යන්තරව ගහනවා. මම ඒ හැම කෙනෙකුගෙන්ම අහනවා, ඇයි මට ගහන්නේ මම පුංචි මිනිහෙක් නිසාද, මේ රටේ ජනාධිපති ධුරයට පත් වූ හය දෙනාගෙන් මම තමයි මේ රටේ පැල්පතින් ආපු, කුඹුරෙන් ආපු ජනාධිපතිවරයා. ඒක මම පැහැදිලිව කියනවා.

මට ගහන්නේ මම ප්‍රභූ පන්තියේ නොවන නිසාද, මට ගහන්නේ මම ධනපති පන්තියේ නොවන නිසාද, මට ගහන්නේ මගේ තාත්තා දුප්පත් ගොවියෙක් නිසාද, මට ගහන්නේ මගේ තාත්තා දෙවන ලෝක යුද්ධයේ සටන් කළ රණවිරුවෙක් නිසාද, මට ගහන්නේ මගේ තාත්තාගේ අක්කර පහෙන් යැපිලා පාර්ලිමේන්තුවට ආපු එතැන් සිට ජනතාවගේ සියලු වගකීම් සමග ඉදිරියට ආ පුංචි මිනිසෙක් නිසාද කියලා මට පහරදෙන අයගෙන් මම අහනවා.

ජනවාර්ගික ප්‍රශ්නය පිළිබඳව බණ්ඩාරනායක මැතිතුමාට හොඳ දැක්මක් තිබුණා

බණ්ඩාරනායක මැතිතුමා එදා කිව්වේ 56 ආණ්ඩුව කියන්නේ පොදු ජනතාවගේ ජයග්‍රහණයක් කියලයි. මාර්ටින් වික්‍රමසිංහ මහත්තයා එය හඳුන්වන ලද්දේ බමුණු කුලය බිඳ වැටීම කියලා. අද මේ රටේ රාජ්‍ය සේවයේ රාජ්‍ය තාන්ත්‍රිකයින්

**මේ සම්මුතිවාදී ආණ්ඩුව තුළ රටේ තිබෙන මූලික ප්‍රශ්න විසඳා ගන්න අපි සියලුදෙනා එක්විය යුතුයි.**

ලෙස රටින් පිට සේවය කරන රාජ්‍ය නිලධාරීන් සහ දේශපාලනඥයින් සියලුදෙනාම බිහි වුණේ බණ්ඩාරනායක මැතිතුමාට පින් සිද්ධ වෙන්න.

56 සමාජ විප්ලවයත් එක්ක විශ්ව විද්‍යාලවලට ගිහිල්ලා සිංහල භාෂාවෙන් උපාධිය ලබන්න, දෙමළ භාෂාවෙන් උපාධිය ලබන්න ඉඩ දුන්නේ බණ්ඩාරනායක මැතිතුමා කියන එක අමතක කරන්න එපා. එතෙක් මේ රටේ සියලුදෙනාම උසස් අධ්‍යාපනය ලබා ඇත්තේ ඉංග්‍රීසි භාෂාවෙන්.

බණ්ඩාරනායක මැතිතුමාට මේ රටේ ජනවාර්ගික ප්‍රශ්නය පිළිබඳ හොඳ ඥානාන්විත අවබෝධයක් තිබුණා. එතුමා බණ්ඩාරනායක - චෙල්වනායගම් ගිවිසුම අත්සන් කළා. නමුත් කරන්න දුන්නේ නැහැ. ඩඩ්ලි සේනානායක මැතිතුමා ඩඩ්ලි - චෙල්වනායගම් ගිවිසුම අත්සන් කළා. ඒකත් කරන්න දුන්නේ නැහැ. අවසානයේ අපි යුද්ධයකට පැටළුණා. ඉන්දියා හමුදාව මේ රටට ආවා, 13 වන ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාව ආවා. පළාත් සභාව ආවා. නමුත් මුලින් කළයුතු දේ අපි මුලින් කළානම් ඒ මහා ඛේදවාචකයන්ට මුහුණ දෙන්න සිද්ධ වෙන්නේ නැහැ.

අදත් අපි කරන සංහිඳියා වැඩපිළිවෙළට සමහර අය නින්දා කරනවා, අපහාස කරනවා, ෆෙඩරල් සංහිඳියාව කියනවා, රට කඩන සංහිඳියාව කියනවා. බටහිරට පාවා දෙන, ජාත්‍යන්තර සංවිධානවලට යට කරන සංහිඳියාව කියනවා. බණ්ඩාරනායක මහත්තයා බණ්ඩාරනායක -චෙල්වනායගම් ගිවිසුම ගේනකොටත් ඔහොම තමා කිව්වේ. සෙවළ බණ්ඩා රට කඩන්න හදනවා කියලා කිව්වා. මේ ඉතිහාසය අධ්‍යයනය කරන්න, මේ ඉතිහාසය කියවන්න, ධර්මපාලතුමා එදා කිව්වේ සිංහලයිනි නැගිටිව් කියලා, මම අද ජනාධිපතිවරයා විදියට වගේම මේ රටේ ජනතාවගේ සේවකයා විදියට මා මුළු රටටම හඬගා

කියන්නේ ලාංකිකයිනි නැගිටිව් කියලයි. සමහර අය අර්ථ විග්‍රහ කරන විදියට මේ රට කිසිදු විදේශ බලවේගයට යටත් කරන්න මම ඉඩ දෙන්නේ නැහැ. කිසිදු විදේශීය අතපෙවීමකට ඉඩ දෙන්නේ නැහැ. කිසිදු විදේශ තර්ජනයක් අපිට නැහැ. එවැනි තර්ජනයක් ආවොත් එම තර්ජනවලට මම ඔළුව පාත් කරන්නෙත් නැහැ. මාතෘ භූමිය, රට සහ ජනතාව වෙනුවෙන් මම දිවි හිමියෙන් පෙනී සිටිනවා.

අපිට අවශ්‍ය හොඳ රටක්, සිංහල, දෙමළ, මුස්ලිම් සියලු ජන කොටස් එකට අත්වැල් බැඳගත්ත එකම රටක සහෝදරත්වයෙන් ජීවත්වන සමාජයක්. හැම කෙනෙකුටම සතුටින් ජීවත්විය හැකි රටක්. ඒ රට හදන්න අපි සියලුදෙනා එකට එකතු වෙන්න ඕන.

ඒ නිසා ශ්‍රී ලංකා නිදහස් පක්ෂය විදියට පක්ෂයේ වසර 65 ගමන් මග අභියෝගාත්මකයි. විශිෂ්ටයි, ශ්‍රේෂ්ඨයි වගේම කටුකයි. නැගිටිනවා, වැටෙනවා, වැටි වැටි නැගිටිනවා කොතෙක් වැටුණත් නැගිට, නැගිට ඉදිරියට යන පක්ෂය ශ්‍රී ලංකා නිදහස් පක්ෂයයි කියලා අපි කියනවා. ඒ නිසා මේ රට, ජනතාව ඒ සියල්ලත් එක්ක අද අපි යන මේ සම්මුතිවාදී ආණ්ඩුව තුළ රටේ තිබෙන මූලික ප්‍රශ්න විසඳා ගන්න අපි සියලුදෙනා එක්විය යුතුයි. කෝටි නව ලක්ෂයක ණය බරින් මිදෙන්න අපි එකතු වෙන්න ඕන. මේ කෝටි නව ලක්ෂයක ණය බර අත්හරින්න ද කියන්නේ. මේ ණය බරින් අපි නිදහස් වෙන්න ඕන. ඒක එක පක්ෂයකට භාරදීලා බැහැ. එක ජාතියකට භාරදීලා බැහැ.

එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කොමිෂන් සභාව හරහා ඇවිත් තිබෙන යෝජනා පිළිබඳ කතා කරන විට  අපි බලයට පත්වීමත් සමග එහි තිබූ බරපතළ තත්ත්වය ඉතාම සරල වුවත් ඒ යෝජනා ජයග්‍රහණය කරන්න අපි සියලුදෙනා එකාවන්ව එකතු වෙන්න ඕන. විවේචනය හොඳයි.

ඒත් විවේචනවලින්ම ප්‍රශ්න විසඳන්න බැහැ. යථාර්ථය තේරුම්ගෙන මේ රට ගොඩනගන්න, මේ රටේ ජනතාවට හොඳ අනාගතයක් හදන්න, අද ජීවත්වන ජනතාවට වගේම හෙට උපදින දරුවන්ට පින්බර, සුන්දර රටක් හදන්න නම් ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ශක්තිමත් කිරීම වගේම සියලු ජනකොටස් සමග සංහිඳියාවෙන් සියලු දේශපාලන පක්ෂ සමග අද දවසේ වගකීම ඉටු කරමින් අපි ඉදිරියට යාමේ අවශ්‍යතාවය තිබෙනවා. අපි අදට අවශ්‍ය දේ අද කළයුතු වෙනවා. රෝගියෙකුට අදට අවශ්‍ය බෙහෙත හෙට දීලා හරියන්නේ නැහැ අද දෙන්න ඕන.

මේ රටට තිබුණු පළමුවෙනි ප්‍රශ්නය ජාත්‍යන්තර දෝෂාරෝපණය, චෝදනා, අවලාද ඒ සියල්ලෙන් මේ රට නිදහස් කරගෙන හමාරයි කියන එක ඉතා පැහැදිලිව මම තමුන්නාන්සේලාට කියන්න ඕන.

කවුරුන් කෙසේ කොහොම කිව්වත් අපි අලුත් ආණ්ඩුවක් විදියට මහා බරක් අඩු කරගෙන තිබෙනවා. ඒ නිසා මේ ප්‍රශ්න සහ ගැටලු තේරුම් අරගෙන, අපිට තිබෙන අභියෝග තේරුම් අරගෙන අපි ආණ්ඩුවක් විදියට වගකීම් ඉටු කරනවා වගේම ශ්‍රී ලංකා නිදහස් පක්ෂය විදියට අපේ වගකීම් සහ යුතුකම් ඉටු කරමු. ඒ සඳහා මා සියලු දෙනාටම ආරාධනා කරනවා.

ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ
65 වන සංවත්සර උළෙල අමතා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සභාපති
ජනාධිපති ගරු මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා කළ කතාව
(2016-09-04 කුරුණෑගල මාලිගාපිටිය ක්‍රීඩාංගණයේ දී)



# ශ්‍රී ලාංකීය ජාතියක් ගොඩනැඟීමේ වගකීම

අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මැතිතුමා ඇතුළු ඔබ සියලු දෙනාගෙන් අවසරයි. අද එක්සත් ජාතික පක්ෂයේ 70 වන සමරු උළෙල පවත්වන අවස්ථාවයි. 2015 ජනවාරි මස 08 වෙනිදා පැවැති මැතිවරණයට එක්සත් ජාතික පක්ෂය ප්‍රමුඛව දේශපාලන පක්ෂ, විවිධ සංවිධාන, වෘත්තීය සංවිධාන, සිවිල් සංවිධාන රාශියක එකමුතුවෙන් පොදු අපේක්ෂකයා ලෙස මාව තෝරාගෙන මේ රටේ ජනතාවගේ හැට දෙලක්ෂ පනස්දහසකට ආසන්න ඡන්ද සංඛ්‍යාවක් මා වෙත ලබා දී ඒ හැට දෙලක්ෂ පනස්දාහෙන් වැඩි කොටස හිමි එක්සත් ජාතික පක්ෂයේ 70 වෙනි සමුළුවට මා වෙත ආරාධනා කිරීම පිළිබඳව ඔබ සියලු දෙනාට මාගේ ගෞරවනීය ස්තූතිය පුදකරනවා.

අපි මේ රටේ ජනතාවගේ නිදහස, ප්‍රජාතන්ත්‍රවාදය තහවුරු කිරීමේ මූලික වගකීම බාරගෙන සිටින පිරිසක්. ඔබ අපිට වගේම මේ රටේ සියලු දේශපාලන පක්ෂවලට, සිවිල් සංවිධාන ඇතුළු රාජ්‍ය ආයතන වලට මේ රට යහපත් රටක් කරන්න වගකීම පැහැදිලිවම තිබෙනවා.

## තිරසාර සමාජ පරිසරයක් නිර්මාණය කරලීම

එජාපයේ මුල් නායකත්වය දැරුවේ ඩී.එස්. සේනානායක මැතිතුමා. ඔහුගේ නායකත්වය තුළ එදා එක්සත් ජාතික පක්ෂයේ පිහිටුවන වෙලාවේදී ශ්‍රී ලංකා නිදහස් පක්ෂය නිර්මාතෘවරයා වූ බණ්ඩාරනායක මැතිතුමා එජාපයේ උපසභාපති ධුරය දැරූ බව අප දන්නවා. අපි රටක් පිළිබඳව ඇති වගකීම් පිළිබඳව සිත්හි ධාරණය කරගෙන කටයුතු කළ ආකාරය පිළිබඳව ප්‍රතිපත්ති, දේශපාලන න්‍යායන්, මෙන්ම මූලධර්ම සමග අපේ පොදු වගකීම් රාශියක් තිබෙනවා. 1946 එජාප නායක වූ ඩී.එස්. සේනානායක මැතිතුමා කළ ප්‍රකාශයක් තිබුණා. එතුමා 1946 සැප්තැම්බර් මස 06 වනදා කිව්වා සිංහල, දෙමළ, මුස්ලිම්, බර්ගර් යනාදී බේදයකින් තොරව අපි ශ්‍රී ලාංකීය ජාතියක් වන බව.

ඔබ අද සම්මත කරගත් සම්මේලන යෝජනාවේ අපගේ මතවාදය යන පිටුවෙහි කිසිදු විදේශීය බලවේගයකට ජනතාවගේ පරමාධිපත්‍ය යටපත් කිරීමට, හෑල්ලු කිරීමට හෝ බලපෑම් කිරීමට ඉඩ නොදීමට ද බහුතර සිංහල ජනතාවගේ සාඩම්බර උරුමය හා සංස්කෘතිය තව තවත් ඔප්නංවාලීමට හා ඔවුන් සමග ලක්මව පෝෂණය කළ අනෙකුත් ජනවර්ගයාගේ සංස්කෘතියන් ආරක්ෂා කරමින් තිරසාර සමාජ පරිසරයක් නිර්මාණය කරලීම සඳහා නිරන්තරව ක්‍රියාත්මක කරවීමට ද වසර 2500ක ට එහා දිවෙන අභිමානනීය ඉතිහාසයක උරුමකරුවන් ලෙස බුද්ධාගමට ප්‍රමුඛත්වය ලබාදෙමින් සෙසු ආගම් ඇදහීමේ හා විශ්වාස කිරීමේ අයිතිය තහවුරු කිරීම යන කරුණු යෝජනාවේ ඇතුළත් කර තිබෙනවා.

අද මේ රට මුහුණ දී තිබෙන දේශපාලන, ආර්ථික අර්බුදය, පිළිබඳව බුද්ධියෙන් හා පරිණතභාවයෙන් අධ්‍යයනය කරමින් කටයුතු කිරීම අවශ්‍යයි. එදා ඩී.එස්. සේනානායක මැතිතුමාත් කිව්වා සියලු ජාතීන්ගේ සමගියෙන් රට ගොඩනැගීම පිළිබඳව. අපි වසර 70ක ට පසු අදත් කියනවා සියලු ජාතීන්ගේ සමගිය හා එකමුතුභාවය පිළිබඳව. අවුරුදු

70 ක් තුළ ඒ කතා කළ ප්‍රශ්නයේ ස්වභාවය සමග විසඳුමක් ඇතිවී නොමැති බවත් පිළිගන්න වෙනවා. එහි ප්‍රතිඵලය වන්නේ, අවුරුදු 30ක දීර්ඝ කාලීන ම්ලේච්ඡ ත්‍රස්තවාදීන්ගේ යුද්ධය.

අපි ආණ්ඩුවක් ලෙස කටයුතු කිරීමේ දී 2015 ජනවාරි 08 වෙනිදා තමුන්නාසේලා අපි එකතුවී සාදපු අලුත් ආණ්ඩුවට රටේ ජනතාව ඡන්දය භාවිතා කළේ හැට දෙලක්ෂ පනස් දාහකට ආසන්න සංඛ්‍යාවක්. අපි රටට ඉදිරිපත් කළ මැතිවරණ ප්‍රකාශනයෙහි, ප්‍රතිඥාවේ තිබෙන්නා වූ කරුණු ඉෂ්ට කිරීම සඳහායි. ඒ තිබෙන්නාවූ කරුණුවලට රටේ ජනතාව මටත්, රනිල් වික්‍රමසිංහ අගමැතිතුමාටත් ඒ සම්මුතිය අත්සන් කළ දේශපාලන පක්ෂ සංවිධාන 49 ත් දුන්නා වූ වරම සහ බලය තුළ, මැතිවරණ ප්‍රකාශනයෙහි සඳහන් කරුණු වැරදියි කියා මේ රටේ කිසිවෙකුගේ මුවගින් වචනයක් පිටවූයේ නැහැ.

2015 ජනවාරි 08 වෙනිදා පැවැත්වූ මැතිවරණයෙන් ජයග්‍රහණය කොට 09 වෙනිදා සන්ධ්‍යාවේදී දිවුරුම් දීමෙන් පසුව මේ රටේ ජනාධිපතිවරයා සහ ප්‍රධාන මහජන සේවකයා ලෙස මා පැහැදිලිව කැපවී සිටින්නේ මැතිවරණ ප්‍රකාශනයේ කරුණු දිවිහිමියෙන් ඉටු කිරීම සඳහායි යන්න පැහැදිලිව තමුන්නාන්සේලාට කිවයුතු වෙනවා. මගේ වගකීම ඒ කරුණු ඉෂ්ට කිරීමයි. තමුන්නාන්සේලා අපි සියලු දෙනා එක්ව ඒ වගකීම ඉෂ්ට කිරීම සඳහා කැපවී සිටිනවා. අපි පාර්ලිමේන්තුවේ 2/3 ක බලයක් ගෙන 19 වෙනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව, සංශෝධිත ව්‍යවස්ථාව සම්මත කරනු ලැබුවා. ස්වාධීන කොමිෂන් සභා හැදුවා. එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කොමිසම හරහා අපිට ආ යෝජනාවලට මුහුණ දුන්නා. මුහුණ දෙනවා.

**අපි අද ඒ ප්‍රශ්නයට මුහුණ දී තිබෙනවා. ඒවාට අපි විසඳුම් සොයනවා.**

මම නියෝජනය කළ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ, එක්සත් ජනතා නිදහස් සන්ධානයේ නායකයාට ඒදා මම ඒ ආණ්ඩුවේ ඇමැතිවරයෙකු ලෙස

**අපි ප්‍රශ්නවල ගැඹුරුබව, සංකීර්ණත්වය තේරුම් ගත යුතුයි.**

අවුරුදු දෙකක් තියා ජනාධිපතිවරණයට යන්න එපා කියද්දී, එක්සත් ජනතා නිදහස් සන්ධානයේ සියලු දෙනා එපා කියද්දී ඔහු කිසිවෙකුට සවන් නොදී මැතිවරණයකට ගොස් ඔහු ලබා ගත් ඉරණම විඳින්න සිදු වූයේ ආර්ථික අර්බුදයට සහ මානව හිමිකම් කොමිෂන් සභාවේ යෝජනාවලට ඔහුට මුහුණ දීමට තිබූ නොහැකියාව නිසා බව මා ඉතා පැහැදිලිව ප්‍රකාශ කරනවා. අපි අද ඒ ප්‍රශ්නයට මුහුණ දී තිබෙනවා. ඒවාට අපි විසඳුම් සොයනවා. කෝටි නව ලක්ෂයක ආර්ථික අර්බුදයට සහ මානව හිමිකම් කොමිෂන් සභාවේ යෝජනාවලට විසඳුම් ආණ්ඩුවක් සහ රටේ ජනතාව ලෙස මුහුණ දෙමින් විසඳුම් ක්‍රියාත්මක කරන විට නොයෙකුත් විවේචන, චෝදනා, අපහාස සහ නින්දා කරනවා. බොහෝම පැහැදිලියි තමුන්නාන්සේලාගේ මැතිවරණ ප්‍රකාශනය. ඉතා පැහැදිලි ලෙස තමුන්නාන්සේලා කියනවා, කිසිදු විදේශීය බලවේයකට දේශයේ ස්වාධීපත්‍ය සහ ජනතාවගේ පරමාධිපත්‍ය යටත් කිරීමට, හෑල්ලු කිරීමට හෝ බලපෑම් කිරීමට ඉඩ නොතබන බව.

ගිය ඉරිදා කුරුණෑගල පැවැති ශ්‍රී ලංකා නිදහස් පක්ෂ සම්මේලනයේදී සම්මත වූයේ මෙවැනිම යෝජනාවක්. එක්සත් ජාතික පක්ෂයටත්, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයටත් මේ සටන් පාඨය තුළ එකට සිට මේ රට ගොඩනගන්න පැහැදිලිවම හැකියාවක් තිබෙන බව මා සියලු දෙනාට මතක් කළ යුතුයි. අපි ප්‍රශ්නවල ගැඹුරුබව, සංකීර්ණත්වය තේරුම් ගත යුතුයි. බලයක් නොමැතිව කරන්නාවූ විවේචන සමග බොහෝ සරල දේවල් ප්‍රකාශ කළ හැකියි. එහෙත් වගකීම් දරන පිරිසක් විදියට අපි මේ සියල්ල සඳහා කැපවී සිටිනවා. මේ රටේ අවශ්‍ය දේශපාලන ප්‍රතිසංස්කරණ, නිදහස, ප්‍රජාතන්ත්‍රවාදය, මානව හිමිකම්, මූලික අයිතිවාසිකම් ශක්තිමත් කරමින් මේ රටේ මහා ආර්ථික අර්බුදයෙන් ගොඩගෙන අපේ රට සමෘද්ධිමත් රටක් කිරීමට අපි සියලු දෙනාම එකඟවී ඇති සම්මුතිවාදී ආණ්ඩුව ශක්තිමත් කරගනිමින් ඒ තුළ අපේ මැතිවරණ ප්‍රකාශනයේ කරුණු ඉටු කරමින් මේ රටේ පොදු

මහජනතාවට නිදහස්, ප්‍රජාතන්ත්‍රවාදී, සුඛිත - මුදිත සමාජයක් ගොඩනැගීමට මමත් රනිල් වික්‍රමසිංහ අගමැතිතුමා ඇතුළු අපි සියලු දෙනාම කැපවෙන බව තමුන්නාන්සේලාට පැහැදිලිව ප්‍රකාශ කරන්න ඕන.

පසුගිය ජනවාරි මාසයේ 08 වෙනිදා මේ රටේ ජනතාව විසින් පරාජය කරනු ලැබූ බලවේග, ප්‍රතික්ෂේප කරනු ලැබූ බලවේග, දූෂණය, වංචාව,හොරකම, නාස්තිය, පවුල්වාදය මේ රටේ නැවත ඇති නොවන ආකාරයට මේ රටේ නිදහස් ප්‍රජාතන්ත්‍රවාදී, ජාතික සංහිඳියාව ශක්තිමත් කරන රටක් ගොඩනැගීමේ කාර්යයට අප සියලු දෙනාම අද කැපවී සිටිනවා. සිංහල, දමිළ, මුස්ලිම් සියලු ජන කොටස්වලට ඉතා සාධාරණ ලෙස රටේ සියලු දෙනාට පිළිගත හැකි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් සඳහා අපි කැපවී සිටිනවා.

අපේ නායක හාමුදුරුවනේ මම ඉතා කණගාටුවෙන් කියන්නට ඕන, අලුත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව පිළිබඳව අපි කරන කටයුතු සම්බන්ධයෙන් අසත්‍ය ප්‍රචාරණයන් රටේ ජනතාවට යවනවා. ජනතාව නොමඟ යවනවා. ඇතැම් මාධ්‍ය ආයතන වැරදි වාර්තාවන් පළ කරනවා. මම අද කියෙව්වා හෙට පළ වන ජාතික පුවත්පතක ලිපියක්. සම්පූර්ණයෙන්ම අසත්‍යයෙන් පිරී තිබෙනවා. මේ රටේ ජනතාව උගත්, බුද්ධිමත් පරිණත ජනතාවක් විදියට මම සියලු මාධ්‍ය ආයතනවලින් ඉල්ලීමක් කරනවා අලුත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සම්බන්ධයෙන් තැන් තැන්වල කතා කරන අසත්‍ය දේ ජනතාව නොමඟ යැවීම සඳහා පළ කරන්න එපා කියා. එම ජාතික අපරාධය කරන්න එපා. අපේ උත්සාහය හොඳ රටක් හදන්නයි.

ඩී. එස්. සේනානායක මැතිතුමා අවුරුදු 70කට කලින් කතා කළ දේ අපිට අදත් කතා කිරීමට සිදුවී තිබේනම්, එස්. ඩබ්ලිව්. ආර්. ඩී. බණ්ඩාරනායක මැතිතුමා 56 ආණ්ඩුවක්

**බණ්ඩාරනායක වෙල්වනායගම් ගිවිසුමත් එක්ක අපිට අදත් කතා කරන්න සිදුවී තිබෙනවා නම්**

**මේ රටේ නැවත යුද්ධයක් ඇති නොවීමට වගබලා ගැනීම අපි සියලු දෙනාගේ වගකීමක් සහ යුතුකමක් වෙනවා.**

හදලා එදා එතුමා කතා කළ දේ බණ්ඩාරනායක - වෙල්වනායගම් ගිවිසුමත් එක්ක අපිට අදත් කතා කරන්න සිදුවී තිබෙනවා නම් 1960 ගණන්වල ඩඩ්ලි සේනානායක මැතිතුමා සහ වෙල්වනායගම් මැතිතුමා කතා කළ දේ අපිට අදත් කතා කිරීමට සිදුවී තිබේනම්, එදා ඒ කතා කළ දේවල් වල ප්‍රතිඵල නායකයන් විසින් තේරුම් ගෙන ඒවා ක්‍රියාත්මක කිරීමට ගියවිට ඒවාට අකුල් හෙළුවානම් එහිදී අවසාන ප්‍රතිඵලය වූයේ දීර්ඝ කාලීන යුද්ධයක් නම් මේ රටේ නැවත යුද්ධයක් ඇති නොවීමට වගබලා ගැනීම අපි සියලු දෙනාගේ වගකීමක් සහ යුතුකමක් වෙනවා.

එක්සත් ජාතික පක්ෂයේ 70 වෙනි වාර්ෂික මහා සමුළුවේදී තමුන්නාන්සේලා සම්මත කරන ලද යෝජනා ඉතා අගය කරමින් උතුම් ශ්‍රී ලංකාව ලෝකයේ ප්‍රබුද්ධ, විශිෂ්ට රාජ්‍යයක් ලෙසත් සමාජ අසමානතාවය තුරන්කොට ස්වදේශිකත්වය මුල් කරගත් ස්වදේශික වාදය තුළ ස්වාධිපත්‍ය තහවුරු කරගනිමින් ජාතික අනන්‍යතාවය තහවුරු කරමින් ශ්‍රී ලාංකිකයින් විදියට කටයුතු කරමින් එදා ඩී.එස්. සේනානායක මැතිතුමා, එස්. ඩබ්ලිව්. ආර්. ඩී. බණ්ඩාරනායක මැතිතුමා කතා කළා මෙන්, අනගාරික ධර්මපාලතුමා කිව්වා "සිංහලයිනි නැගිටිව්" කියා. මම මේ රටේ පොදු මහජනතාවගේ සේවකයා විදියට මම කියනවා "ශ්‍රී ලාංකිකයිනි නැගිටිව්" කියා.

තමුන්නාන්සේලා අපි හෙට උපදින දරුවන්ට හොඳ රටක් හදමු. ජාතික සංහිඳියාව ශක්තිමත් කරමින් මුළු සමාජ සංස්ථාව තුළම සාමය ස්ථිර කරමින්, බිය සැක තුරන්කොට සියලු ජනතාවට නිදහසේ සතුටින් සිටිය හැකි සමාජයක් ගොඩනගන්න අපි සියලු දෙනාම කැප වෙමු. ඒ තුළ සම්මුතිවාදී ආණ්ඩුවේ යුතුකම් සහ වගකීම් ඉටු කරමින් සියලු දෙනා සහෝදරත්වයෙන් සහ මිත්‍රත්වයෙන් අපේ උතුම් මාතා

භූමිය ගොඩනැගීමට කැපවෙමුයි කියා ඔබෙන් සමුගන්නවා. ස්තුතියි. තෙරුවන් සරණයි.

එක්සත් ජාතික පක්ෂයේ 70 වන සංවත්සර උළෙල අමතා
ජනාධිපති ගරු මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා කළ කතාව
(2016-09-10)

ජනාධිපති කාර්යාලය
පුස්තකාලය


pmd
President's Media Division